# මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
# நிதி மற்றும் பொருளாதார விவகாரங்கள் அமைச்சு
# MINISTRY OF FINANCE AND ECONOMIC AFFAIRS

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PE/COP/POLI/Circulars
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2018.12. 07

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 03/2018

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත

**<u>රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලයට 2018 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ගෙවීම</u>**

**01. ප්‍රසාද දීමනා ගෙවීම**

2018 වර්ෂය සඳහා රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලය සඳහා ප්‍රසාද දීමනා ගෙවීම පහත පරිදි සිදු කළ යුතු ය.

| අනු අංකය | ආයතනික වර්ගීකරණය | යෝජිත ප්‍රසාද දීමනාව |
|---|---|---|
| 1. | 2016 මූල්‍ය වර්ෂයේ අලාභදායී තත්ත්වය 2017 මූල්‍ය වර්ෂය තුළ දී ලාභදායී බවට පත් කර ගෙන ඇති ආයතන ද ඇතුළත්ව 2017 මූල්‍ය වර්ෂය තුළ දී ලාභ උපයාගෙන ඇති සහ පැමිණීම, කාර්යසාධනය හෝ වෙනත් පදනමක් මත <u>දිරිකාරක ගෙවනු නොලබන හෝ නොගෙවූ</u> රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් | රු. 15,000/- |
| 2. | 2016 මූල්‍ය වර්ෂයේ අලාභදායී තත්ත්වය 2017 මූල්‍ය වර්ෂය තුළ දී ලාභදායී බවට පත් කර ගෙන ඇති ආයතන ද ඇතුළත්ව 2017 මූල්‍ය වර්ෂය තුළ දී ලාභ උපයාගෙන ඇති සහ පැමිණීම, කාර්යසාධනය හෝ වෙනත් පදනමක් මත <u>දිරිකාරක ගෙවනු ලබන හෝ ගෙවනු ලැබ ඇති</u> රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් | රු. 13,500/- |

| | | |
|---|---|---|
| 3. | 2017 මූල්‍ය වර්ෂය තුළ දී අලාභ තත්ත්වයක් වාර්තා කර ඇති, එහෙත් 2016 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව එම <u>අලාභදායී බව අඩු කරගෙන</u> ඇති රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් | රු. 5,000/- |
| 4. | 2016 මූල්‍ය වර්ෂය තුළ දී අලාභ තත්ත්වයක් වාර්තා කර ඇති හා එම **<u>අලාභදායී බව 2017 මූල්‍ය වර්ෂය තුළ දී අඩු කර ගැනීමට අපොහොසත් වූ</u>** රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්, එවැනි ආයතන වල සේවය කරන සේවකයින් කෙරෙහි සානුකම්පිතව සලකා බලා. | රු. 3,000/- |

**02. අනුගමනය කළ යුතු පිළිවෙළ**

2.1 ප්‍රසාද දීමනාවක් සේ සලකනු ලැබිය හැකි අර්ධ වාර්ෂික දීමනාවක් කිසියම් ආයතනයක් විසින් සිය කාර්ය මණ්ඩලයට ගෙවා ඇති විටෙක, එම ගෙවීම අතිරේක ප්‍රසාද දීමනාවක් සේ සැලකීමට විශේෂ අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ඇත්නම් මිස, එය වසර අවසානයේ ගෙවනු ලබන වාර්ෂික ප්‍රසාද දීමනාවේ අත්තිකාරමක් සේ සැලකිය යුතු ය.

2.2 2017 මූල්‍ය වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ගෙවීමට පෙර මෙම චක්‍රලේඛ උපදෙස් පරිදි එම ප්‍රසාද දීමනා ගණනය කිරීම නිවැරදිව සිදු කර තිබේ ද යන්න තහවුරුව සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ පාලක සභාවේ අනුමැතිය ලබා ගත යුතු ය. මෙසේ ප්‍රසාද දීමනා ගෙවීමට පෙර සේවක අර්ථ සාධක අරමුදල්, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල්, පාරිතෝෂික හා උපයන විට බදු ගෙවීම් ආදී සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් සඳහා ප්‍රතිපාදන සැලසීමට සියලුම රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල අවධානය යොමු විය යුතු ය.

2.3 මෙම චක්‍රලේඛයේ 01 හි පරිදි ප්‍රසාද දීමනා ගෙවීම සඳහා, අදාළ රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්, 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 සමඟ නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායයන්හි යහපාලනය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.5 ඡේදයේ විධිවිධානයන් නිසි පරිදි පිළිපැද තිබිය යුතු ය.

**03. විශේෂ කරුණු**

3.1. ප්‍රසාද දීමනා ගෙවීම සඳහා අරමුදල් මහා භාණ්ඩාගාරය විසින් සපයනු නොලැබේ.

3.2 සාමූහික ගිවිසුම් හෝ ඒ හා සමාන අවබෝධතා ගිවිසුම් මඟින් හෝ වැටුප් හා දීමනා ක්‍රියාත්මක කරන රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වලට මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාළ නොවේ.

3.3. භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයන්හි ප්‍රතිපාදනවලින් බැහැරව 2017 වර්ෂයේ දී ප්‍රසාද දීමනා ගෙවීමට විශේෂ අමාත්‍ය මණ්ඩල අනුමැති ලබා ගෙන ඇති සහ 2018 වසරේ දී ද එකී විශේෂ අනුමැතිය ලද පටිපාටියම අනුගමනය කර ප්‍රසාද දීමනා ගෙවීමට අදහස් කරන ආයතන ඒ සඳහා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු ය.

**04.** පැහැදිලි කර ගැනීම්

මෙම චක්‍රලේඛය පිළිබඳව කිසියම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රතිපත්ති), පී.එච්.ඒ.එස්. විජයරත්න මහතා (11 – 2484627) හෝ අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති), එච්.ඒ.එන්.එස්. කුමාර මහතා (011 – 2484625) විමසන ලෙස කාරුණිකව දන්වමි.

එස්. ආර්. ආටිගල
භාණ්ඩාගාර ලේකම්

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති
5. සභාපති, ජාතික වැටුප් කොමිෂන් සභාව
6. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව